www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# හමුදා පිටුබලය ලත් බංග්ලාදේශ ආන්ඩුව මාස 18 කින් මැතිවරනය කල් දමයි

## Military-backed regime in Bangladesh postpones elections for 18 months

**විමල් පෙරේරා සහ සරත් කුමාර විසිනි**
**2007 අප්‍රියෙල් 17**

බංග්ලාදේශයේ භාරකාර ආන්ඩුව 2008 වසරේ අග වන තුරු, අවම වශයෙන් මාස 18 කින්, ජාතික සහ ප්‍රාදේශීය මැතිවරණ කල් දමන බව අප්‍රියෙල් මාස 5 දා නිවේදනය කලේය. මෙය හමුදා ආඥාදායකත්වයක් දෙසට ගත් පියවරක් ලෙස පමනක් විග්‍රහ කල හැක. රටේ ව්‍යවස්ථාව නිසැකව ම උල්ලංඝනය කරන මෙම තීරනය මගින්, තම මිලිටරි සහකරුවන් සහිත ව තෝරා පත් නොකරන ලද ආන්ඩුවක් වෙත කාල නියමයක් නැති කාල පරිච්ඡේදයක් දක්වා භාරකාරත්වය පැවරෙයි.

ජනවාරි 22 දින නියමිත ව තිබුනු මැතිවරණය වංචා කරනු ඇතැයි කියා පෑ විරුද්ධ පක්ෂ අවාමි ලීගය සහ එහි මිත්‍ර පක්ෂ විසින් සති ගනනාවක් පුරා සිදු කල මහජන විරෝධතා මගින් තීව්‍ර කරන ලද ගැඹුරු දේශපාලන අර්බුදයක් මග හැරීම සඳහා ජනාධිපති ඉයජුඩින් අහමඩ් ජනවාරි මස 11 දා භාරකාර ආන්ඩුව ඇටවීය. පෙර පැවති භාරකාර ආන්ඩුවේ ප්‍රධානියා ලෙස සිට ඉවත් වූ ජනාධිපති ඉයජුඩින් අහමඩ් විසින් හිටපු මහ බැංකු අධිපතියකු වූ ෆාක්රුදින් අහමඩ් තම හිස් වූ තනතුරට පත් කිරීමෙන් අනතුරුව හදිසි නීතිය පැනෙව්වේ ය.

බන්ග්ලාදේශ ජාතික පක්ෂය -බජාප - විසින් මෙහෙය වූ පැවැති ආන්ඩුව ව්‍යවස්ථානුකූලව තම වසර පහක කාලය නිම කර පසුගිය ඔක්තෝබර් මස ඉවත්විමෙන් දින 90 ක් ඇතුලත මැතිවරනය පැවැත් විය යුතුව තිබ්න. සියලුම අමාත්‍යංශ සහ ආන්ඩුවේ වැඩ කටයුතු අධීක්ෂනය කරන ෆාක්රුදින් අහමඩ් සහ උපදේශකවරුන් අට දෙනා සමග භාරකාර ආන්ඩුව දැන් තම අභිමතය පරිදි බලය අත්පත් කරගෙන ඇත.

අප්‍රියෙල් මස 12 දා පැවැති රූපවාහිනි ඇමතුමක දී ෆාක්රුදින් අහමඩ් පැවසුවේ 2008 අවසානයට ප්‍රථම මැතිවරණයක් පැවැත්විය හැකි බවට තමන්ට ,දැඩි විශ්වාසයක්, ඇති බව ය. ප්‍රමුඛතාවන් ලෙස ඔහු ප්‍රකාශ කලේ "මැතිවරන ප්‍රතිසංස්කරන දූෂනයට එරෙහි සටන, පරිපාලනය දේශපාලන හරනයට පත් කිරීම, අධිකරනයේ ස්වාධීනත්වයත් සහ ජාතික ආර්ථිකයට සම්බන්ධිත අනෙකුත් කරුනු" යන්නය.

මහා පක්ෂවලට මහජනයාගේ ඇති පැතිරී ගිය පිලිකුලට ආයාචනය කරමින්, අහමඩ් ප්‍රකාශ කලේ "අපගේ මෙහෙය පැහැදිලි" බවය. "දූෂකයනගේ, බලය අයුතු ලෙස දූෂ්භාවිතය කරන්නන්ගේ සහ අනෙකුත් ඇට්ටර වූ වරද කරුවන්ගේ නිය පහුරින් සමාජය, රට සහ මහජනතාව නිදහස් කර ගැනීම සඳහා ඔවුන් නීතිය යටතට කඩිනමින් ගෙන ඒමට අපට අවශ්‍ය ය." මෙම දූෂනයට එරෙහි ව්‍යායාමය වනාහි දේශපාලන විරෝධතාවය මර්දනය කිරීමට හදිසි නීතිය යටතේ අසීමිත බලයක් සහිතව අඛන්ඩව ක්‍රියාත්මක වන ආරක්ෂක හමුදාවන් සඳහා ව්‍යාජ ආවරනයකි.

කැපී පෙනෙන දේශපාලනික ක්‍රියා කලාපයක් අත්පත් කර ගනිමින් සිටින හමුදාව මැතිවරනය කල් දැමීමේ තීරනයට ප්‍රබල ලෙස සහය දැක් වීය. හමුදා නායක, ලුතිනන් ජෙනරාල් මොයීන් උදින් අහමඩ් අප්‍රියෙල් 2 දා ඩකා (අගනුවර) හි ජාත්‍යන්තර දේශපාලන විද්‍යා සංගමයේ සංමන්ත්‍රනයකට පැවසුවේ අන්තර්වාර ආන්ඩුව "රටේ නිදන්ගත දුබල පාලනය ජය ගැනීමට නව ආකාරයක ප්‍රජාතන්ත්‍රවාදයක්" ගොඩ නගන බව ය.

"දූෂනය වගා දිගා කරන, අනාරක්ෂිතභාවය සහ අයිතීන් උල්ලංඝනය වීමේ අර්ථයෙන් පාලනය දුබල කරන, සහ දේශපාලන අපරාධකරනය මගින් රජයේ පැවැත්ම හා අවංකත්වයට තර්ජනය කරන, "තෝරා පත් කරන ප්‍රජාතන්ත්‍රවාදය"ට ආපසු යාමට අපට අවශ්‍ය නැත," යනුවෙන් ජෙනරාල්වරයා ප්‍රකාශ කලේ ය. ව්‍යාපාරික ප්‍රජාව අමතමින් ඔහු ප්‍රකාශ කලේ ආර්ථික ව රට පසු බැසීමට දුබල පාලනය වග කිව යුතු බව ය.

ඩේලි ස්ටාර් පුවත් පතෙහි කතු වැකියක් මෙම කථාව විවේචනය කරමින් නිගමනය කලේ: ",ආන්ඩුව පිටුපස සිට සැබෑ බලය ලෙස සැබවින්ම ප්‍රහාර එල්ල කරන්නේ තමා බව හමුදා ප්‍රධානී ජෙනරාල් මොයීන් උදින් අහමඩ් සහතික කර ඇත." භාරකාර ආන්ඩුව විශ්‍රාම ගිය මේජර් ජෙනරාල්වරු දෙදෙනෙකුන් ද හිටපු පොලිස් ප්‍රධානයකුගෙන් ද සමන්විත ය. මැතිවරන

කොමිසමට පලමු වතාවට හමුදා නිලධරයකු එනම් විශ්‍රාමික බ්‍රිගේඩියර් ජෙනරාල් එම්. සක්හවාට් ඇතුලත් කර ඇත. ප්‍රබල දූෂන විරෝධී කොමිසමේ සභාපති වන්නේ විශ්‍රාම ගිය හමුදා ප්‍රධානියකු වන ලුතිනන් ජෙනරාල් හසන් මෂ්හුඩ් චව්ධ්රි ය.

දූෂනය අවසන් කිරීමේ කඩතුරාව යටතේ, ආන්ඩුව දේශපාලන පක්ෂ වෙත කඩා පැන ඇත. බජාප නායිකා කලීඩා සියා සත්‍ය ලෙසම නිවාස අඩස්සියේ රඳවා තබනු ලැබ ඇත. අප්‍රියෙල් 11 දින, පසුගිය ඔක්තෝබර් මස ඩකාහි ඇති වූ දේශපාලන ප්‍රචන්ඩත්වය තුල දී පහර කෑ මරණයට ගොදුරු වූ හතර දෙනෙකු සම්බන්ධිතව අවාමි ලීගයේ නායිකා ෂික් හසීනා වජේඩ් ට එරෙහි ව පොලීසිය මිනී මැරීමේ චෝදනා ගොනු කලේය. ඇමරිකාවේ තම ඥාතීන් බැලීමට ගොස් ඇති හසීනා මෙම චෝදනා දැඩි ලෙස ප්‍රතික්ෂේප කලාය.

ජනවාරි සිට හමුදාව 160 කට අධික ප්‍රමානයක දේශපාලන නායකයින් ද, ව්‍යාපාරිකයින් ද, හිටපු නිලධාරීන් ද රඳවා තබා ඇත. මේ අතර හිටපු බජාප ඇමති මිර්සා අබ්බාස් සහ හිටපු අවාමි ලීග්යේ ඇමති මොෂාරාෆ් හොසේන් ද වෙති. කලීඩාගේ පුත් ඒකාබද්ධ බජාප යේ මහ ලේකම් තරීක් රාහ්මන්, ඉදි කිරීම් සමාගමකින් ඇමරිකානු ඩොලර් 147,000 වංචනිකව ලබා ගැනීම ඇතුලු චෝදනා ගනනාවකට මුහුන දෙමින් සිටියි.

ස්ථිරසාරව, බංගලිදේශයේ දූෂනය මුල්බැසගෙන ඇත. පසුගිය වසරේ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් (ආයතනය) බංගලිදේශය වර්ග කලේ අඛන්ඩව වසර පහක් ලෝකයේ වඩාත්ම දූෂිත රට බව ය. කෙසේ වෙතත්, භාරකාර ආන්ඩුවේ උත්සුකය වන්නේ සාමාන්‍ය මහ ජනයාගේ දුක් ගැනවිල්ල නොව ආයතනගත වී ඇති දූෂනය තම ලාභය සඳහා බාධකයක් වී ඇතැයි සලකන විදේශ ආයෝජකයින්ට ආරාධනා කිරීමය.

ආන්ඩුව මර්දනකාරී පියවරන් මාලාවක් දියත් කර ඇත. අප්‍රියෙල් මස මුල වන විට, ආරක්ෂක හමුදාව 100,000 අධික මහජනයා වටලනු ලැබ ඇති අතර මොවුන්ගෙන් බහුතරය කිසිදු චෝදනාවක් රහිතව රඳවා තබනු ලැබ ඇත. මෙම මෙහෙයුම වෙනුවෙන් 60,000 අධික සොල්දාදුවන් සහ පොලීසිය, විශේෂ බලතල සහිතව, යොදාගෙන ඇත. ඔධිකාර් නැමැති මානව අයිතීන් සංවිධානයට අනුව, ජනවාරි 12 සහ මාර්තු 12 අතර අත් අඩංගුවේ දි 50 ක් පමන මරනයට ගොදුරු වී ඇත.

හදිසි නීතිය යටතේ, ඇප මත නිදහස ලබා ගැනීමේත් ඉහල උසාවියකින් පිලිසරනක් ලබා ගැනීමේත් අයිතිය උදුරා ගනු ලැබ ඇත. ජනවාරි 11 න් පසුව, ප්‍රසිද්ධ රැස්වීම්, වීදි උද්ඝෝෂන මාර්ග බාධක දැමීම් සහ වර්ජන ඇතුලු විවෘත දේශපාලන ක්‍රියාවන් තහනම් කෙරින. මාර්තු 11, ආන්ඩුව අභ්‍යන්තර දේශපාලන ක්‍රියාවන් ද තහනම් කලේ ය. විදේශයන්ගෙන් වැඩ සටහන් ලබා ගැනීමට සහ විසුරුවා හැරීමට සහතික ලබා ගෙන නැතැයි ප්‍රකාශ කරමින් පෞද්ගලික රූපවාහිනී නාලිකා 7 ක් වසා දැමීමට මාර්තු 15 දා නියෝග කලේ ය.

ආන්ඩුව තම “2007 ත්‍රස්ත විරෝධී අඥා පනත“ ප්‍රසිද්ධ කිරීමට ද බලාපොරොත්තු වෙයි. තවමත් කෙටුම් පතක් ලෙස ඇති මෙම ආඥාපනත මහජන ජීවිතය සඳහා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සැපයීමට බාධා කරන, බංගලිදේශයේ ස්වෛරීභාවයට, එකමුතුවට අවංකභාවයට හා ආරක්ෂාවට තර්ජන ඇතුලත් වන “ත්‍රස්ත ක්‍රියා“ විශාල පරාසයක අර්ථ කථනය කරයි. දඩුවම් වශයෙන් ජීවිතාන්ත සිර ගත වීම් සහ මරන දන්ඩනය ඇතුලත් වෙයි.

පාලක ප්‍රභූවේ කිසිදු කන්ඩායමක් - එනම් අධිකරනය, මාධ්‍ය හෝ ප්‍රධාන පක්ෂ - මැතිවරණ කල් දැමීම වත්, ආන්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රමවත් බැරෑරුම් ලෙස අභියෝගයට ලක් කර නොමැත. මහජන අප්‍රසාදය යටතේ මැතිවරනය කැඳවීම සඳහා හමුදාවට බල කෙරෙන තුරු 1980 දක්වා රට හමුදා ආඥාදායකත්වය යටතේ පැවැතිනි. පසුගිය වසර 17 පුරා මාරුවෙන් වාරුවට අවාමි ලීගය සහ බජාප බලයේ සිටියහ. තමන්ගේ තිත්ත එදිරිවාදීකම තිබිය දීම, ගැඹුරුවෙමින් පවතින සමාජ අසමානතාවය සහ පුලුල්ව පවතින හුදකලාවීම ජනනය කල ව්‍යාපාරික ගැති වැඩපිලිවෙලක් පක්ෂ දෙකම ක්‍රියාත්මක කලහ.

තම පාලනයෙන් ඉක්මවා යතැයි යන බිය නිසා හමුදා සහාය ලත් ආන්ඩුවට එරෙහිව මහා ජනයා බලමුලු ගන්වමින් ව්‍යාපාරයක් ගොඩ නැගීමට බ.ජ.ප. පක්ෂයවත් අවාමි ලීගයවත් නුසුදානම් ය. පක්ෂ දෙකම මැතිවරණය කල් දැමීම ප්‍රායෝගිකව පිලිගෙන ඇත. අවාමි ලීගයේ ප්‍රධාන ලේකම් අබ්දුල් ජලීල් ප්‍රකාශ කලේ තම පක්ෂය ,මෙම කාල රාමුව පිලිගන්නා, බව ය. ඔහු සරලවම ආයාචනය කලේ මැතිවරන කොමිසම සමග ප්‍රතිසංස්කරණ හා අනෙකුත් මැතිවරණ සම්බන්ධිත ගැටලු සාකච්ඡා කිරීම හැකි කරවීමට දේශපාලන ක්‍රියාවන් ගැන ඇති තහනම අවසන් කරන ලෙසය.

ආන්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරයන්හි ප්‍රධාන එල්ලය වන්නේ කම්කරු පන්තිය සහ දුගී ජනතාවය. පසුගිය මැයි මස, අඩු වැටුප් සහ සේවා කොන්දේසි වලට එරෙහි උද්ඝෝෂනය කරන ලද දහස් සංඛ්‍යාත කම්කරුවන් ආරක්ෂක හමුදා විසින් මෘග ලෙස මර්දනය කරන ලදී. උද්ඝෝෂන තුලදී කම්හල් 150ක් කොල්ලකෑම් වලට ලක් වූ අතර වාහන සෑහෙන ප්‍රමානයක් අනතුරුට ලක් වූහ. රටේ ප්‍රධාන විදේශ අපනයන ආදායම වන්නේ ඇගලුම් කර්මාන්තය ය.

හමුදා පීටුබලය ලත් ආන්ඩුව වෙලදපොල ප්‍රතිසංස්කරන වේගවත් කිරීමට සැරසෙමින් සිටියි. රටේ විදේශ වෙලදාමේ සියයට අසූවක් හසුරුවන චිතාගොංන්ග් වරායේ සියලුම සේවාවන් පෞද්ගලීකරනය සඳහා ලැයිස්තු ගත කර ඇත. රටේ විශාලතම බැංකුව වන රූපාලි බැංකුව විකුනා දැමීමට නියමිත ය. රටේ දුම්රිය පද්ධතිය පෞද්ගලීකරනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව සමග ගිවිසුම් අත්සන් කරනු ලැබ ඇත.

අරුමයක් නොවන අයුරින්, නව ප්‍රජාතන්ත්‍රවාදී විරෝධී ආන්ඩුවට, ව්‍යාපාරික නායකයින් සහ විදේශ ආයෝජකයින් ප්‍රායෝගිකවම තම සහය දක්වා ඇත. බටහිර ආන්ඩු නිහඩ විවේචන ඉදිරිපත් කර ඇති අතර හැකි ඉක්මනින් මැතිවරන පවත්වන ලෙස ඉල්ලා ඇති නමුත් කිසිදු බලගතු හෙලා දැකීමක් සිදු කර නැත. මහා බලවතුන්ගේ අවශ්‍ය මූලෝපායික සහ ආර්ථික අවශ්‍යතාවලට යම් ආන්ඩුවක් බාධකයක් වන විට පමනක් ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ප්‍රශ්නයක් බවට පත්වෙයි.

© www.wsws.org